# පින් පව් සහ කුසල් අකුසල්


රාජකීය පණ්ඩිත ඉඳුරාගාරේ ධම්මරතන හිමි.

වචනයන්ට අර්ථ කථනය කිරීමේදී එහි අන්තර් ගතයට වඩා වචනයේ ආකෘතිය හා අක්ෂර දෙස වඩාත් අවධානය යොමු කිරීම දේශීය හා මාතෘ භාෂාවල අර්ථ කථනයන්ගේ ස්වරූපයයි. නිබ්බාන යන්නට අර්ථ කථනය කරනුයේ නි+ධාන නිබ්බාන යනුවෙනි. මනුස්සා යන්න මනස්ස උස්සන්නතාති මනුසෙසා යනුවෙන් අර්ථ කථනය කෙරේ. මෙසේ වචනයේ ඓතිහාසික හා වාග් විද්‍යාත්මක පසුබිම හෝ අන්තර්ගත මූලික අර්ථය තැනීමට වඩා එහි අක්ෂර කෙරෙහි සැලකිලි මත්වීමේ ක්‍රමය ........ චිත්තං පුනාතීති පුඤ්ඤං ..... යන්න කෙරෙහිද බලපෑ බව පෙනේ. පින යන්න පිළිබඳ වඩාත් නිවැරදි නිර්වචනය යථොක්ත අටුවා පාඨයට වඩා .... පුඤ්ඤං ති භික්ඛවෙ සුඛස්සේතං අධිවචනං ..... යන පිඨක පාඨය සුදුසු බව පෙනේ. පින කුසලය යනු එකක් සඳහා භාවිත නම් දෙකක් නොවේ. පුණ්‍යය හෙවත් පින යනුවෙන් හඳුන්වනු ලබන්නේ කුශල කර්මයකින් ජනිත වන ඵලයයි. එහිදි පාපය අකුසල විපාකය බව කිවයුතු නොවේ. මේ අනුව පින සහ පව යනු කර්මය නොව කර්ම ඵලය බව පැහැදිලි විය යුතු ය. සිත පිනවීම යනු මෙහිදී සචේතනික කුසල කර්මයක් පදනම් කොටගෙන වන පිනවීම ගැනේ. පින යනු සැපයටම පර්යාය පදයකැයි කරන නිර්වචනය එසේ ගැටළු සහිත වූවක් නොවේ. සැපය යනු කුශල කර්මයකින් ජනිත කුසල විපාකයකි. එනම් පුණ්‍ය විපාකයකි. එසේ නම් සැපය පින යනු සමානාර්ථවත් පද දෙකකි. මෙහිදී චිත්තං පුනාතීති පුඤ්ඤං යන්න ද අර්ථවත් ලෙස අර්ථ කථනය කළ හැකි ය. එනම් සිත තෘප්තිමත් වනුයේ ...... සතුටුදායක වනුයේ පින යනුවෙනි. එහිදී පින කර්මයක් ලෙස නොව කර්ම ඵලයක් ලෙස ගත හැකි ය.

මෙහිදී පින සහ කුසලය අතරත් පව හා අකුසලය අතරත් ඇති පරතරය ගැන අවධානය යොමු කළ යුතු ය. පින සහ පව යනු කර්ම නොවන බව ද ඉහත දැක්විණි. ඒවා පැහැදිලි ලෙසම කර්ම විපාක සඳහා වන නම් දෙකකි. එසේ නම් පුණ්‍ය ඵලය



සහ පාප ඵලය සඳහා කර්මය විය යුත්තේ අකුසල් දෙකයි. පව සඳහා අකුසල යන්නත් පින සඳහා කුසල යන්නත් භාවිත වනු පෙනේ. එහෙත් එහි සියුම් වෙනසක් දැකිය හැකි ය.




මෙහි A යන කොටසින් පින ගතහොත් B යන්නෙන් කුසලය ගත හැකි ය. එම ප්‍රස්තාරයට අනුව කුසලය පිනට වඩා පුළුල් විස්තීර්ණ අර්ථයකින් යුක්ත බව පෙනේ. පිනට අයත් සීමා සියල්ල කුසලයට එකඟ වේ. එනම් පින් සියල්ල කුශල ගණයට ද අයත්වේ. එහෙත් කුසල් සියල්ල පින් ගණයට අයත් නොවේ. කුසලය පින ඉක්මවා යන්නකි. එහෙත් පිනත් කුසලයත් අතර ඇති මේ වෙනස මේ අයුරින්ම පව හා අකුසලය අතර දැකිය හැකි නොවේ. පව සහ අකුසල අතර සම්බන්ධය මීට වඩා සමීප ය.

පින පව දෙකම රැස්කිරීම් ගණයට වැටේ. එනම් එය කරන්නාගේ ගිණුමට බැර වේ. ගිණුමට බැර වූ පින සහ පව විපාක දිය යුතු ය. බ්‍යන්තීකරණය අනිවාර්යය. එනම් පුන පුනා පැවතීමයි. භවගත ප්‍රවෘතියයි. රහතන් වහන්සේ ඉන් වෙනසි. උන්වහන්සේ ඛීන භව නම්. පින පව දෙක එසේ වුවද කුසල් අකුසල් එසේ නොවේ. විශේෂයෙන් කුසල් නිර්වාන මාර්ගයේ පිනට වඩා දුරක් යාමට උපකාරක වේ. විමුක්තිය සොයා යන ගමනේ, පිනේ ලා උපයුක්තිය සුඛිත මුදිත වීම සඳහා පමණි. එහෙත් කුසල් ඉන් මතුවට ද උපකාරකය. කුසල යන පදයේ අර්ථය දක්ෂ යන්නයි. (භාව තද්ධිතය - කුසලතා, කෞශල්‍ය) මෙහිදී කුමක් සඳහා දක්ෂ ද? විමුක්තිය සඳහා ය. ලෝකෝත්තර පදවිය සඳහා ය. අකුසල යනු පරාජිත බවයි. අදක්ෂ බවයි. අකුසල හා කුසල යනු පරාජිත හා අපරාජිත බව මිස සංචයශීලි පදාර්ථයක් නොවේ.

1. 'කුච්ජිතෙ පාපධම්මෙ සලයතී කම්පෙති විද්ධංසෙති අපගමෙතීති කුසල ....... 'කුස වියලනතති කුසලං ...' යන විග්‍රහ වාක්‍ය කුසලය පිළිබඳව කළ නිවැරදි නිර්වචන සේ ගත හැකි නොවේ.

සියළුම කුසල් හා අකුසල් සංයෝජන වශයෙන් බැඳී නැත. එහෙත්,

පින සුගතිය සඳහාත්

පව දුගතිය සඳහාත් වේ.

මේ දෙකම ගති (ගම් - ගමන) ය්. සුඛිතව හෝ දුක්ඛිතව යන ගමන සඳහාත් එය ඉන්ධනයකි. නිවන පුණ්‍ය ඵලයක් නොවේ. නිවන ප්‍රාර්ථනීය ධර්මතාවයක් නොවන බව වටහා ගත යුතු ය. එසේනම් අජරාමර සංඛ්‍යාත නිර්වාණ සම්පත්තිය දානමය කුසල කර්මයක් කොට ලද හැක්කක් නොවන බව වටහා ගත යුතු ය. පින සහ පව එහිලා දක්වන උපයෝගීතාව සීමිත බව ඉන් වැටහේ. එහෙත් කුසලය නිවන සඳහා මහත් උපස්ථම්භකයකි. පින් කළ පමණින් ලද හැකි නිවනක් නැත. මේ අනුව පින සහ පව ආශ්‍රව ධර්මයක් බවත් නිවන් මග ආශ්‍රව යන්ගෙන් තොර (ආසවක්ඛය) බවත් පෙනේ. "...... පුඤ්ඤ පාප පහීනස්ස නත්ථි ජාගරතො භයං........" යි කීයේ එහෙයිනි.

සීල භේදය පාපයකැයි ද ඇතමෙක් සලකති. බෞද්ධ සීලය සමාජය හා ධර්මය පදනම් මත පිහිටියකි. ධම්මචරියා සමචරියා යන්නෙන් එය වර්ගී කළ හැකි ය. පොදුවේ ශිෂ්ඨ සම්මත ශීලාචාර සමාජය විසින් හෙලා දකිනු ලබන ක්‍රියා පාපි ගණයට අයත් ය. ඔවුනොවුන්ගේ ජීවත්වීමේ අයිතියත් සන්තකයන් ආරක්‍ෂා කිරීමට ඉන් බැඳී සිටීමත් නිසාද එය සමස්ත මානව වර්ගයාම රක්‍ෂා කරන හෙයිනි. තවෙකෙකුගේ නිදහස අයුතු ලෙස පැහැර ගැනීම ද එවැන්නකි. මේවා සියල්ලක් පොදුවේ සමස්ත සීලාචාර මානව වර්ගයාගේම හෙලා දැකීමට හේතු වේ. ඒවා පව් ගණයට හැර අන් කවරකට අයත්ද? කොටින් කියතොත් සමස්ත මානව වර්ගයාගේ සමාජ සාමාජිකයකුට හෝ සමාජ වස්තුවකට හෝ සමාජ ධර්මයකට හානි පැමිණවීම අයුක්ති සහගතවීම පවකි. පොදුවේ බෞද්ධයන් වශයෙන් රක්‍ෂා කරන ශීලයට මෙය ඉක්මවා ගිය කොටස් ද ඇතුලත් ය. "... නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලෙපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ....." යන ශික්‍ෂා පදය පෙර කී පරිදි සමාජ විරෝධී අධර්මයකින් වෙන් වීමක් නොවේ. එක්තරා සමාජ



ඒකකයක් විසින් පිළිගනු ලබන විරතියක් පමණි. එවැනි ශික්‍ෂා පදයක් කඩකිරීම පවක් ලෙස ගත නොහැකි ය. එය පොදුවේ මානව වර්ගයාටම කරන අයහපතක් නොවේ. පනවා ගත්තකි. එවැනි ශික්‍ෂා පදයකින් වනුයේ සීල භේදයක් පමණි. වරදකි. පිළිගත් පොරොන්දුව කඩ කිරීම වරදකි. පෙරකී පවත් මෙම වරදත් දෙකම සීල භේදයන් ය. සියළු සීල භේදයන් පව් ලෙස ගත නො හැකි බව මින් පෙනේ. පව් කරන්නා නිරතුරුව තථාගතයන් වහන්සේගේ අවර්ණතාවට බඳුන් විය. මේ ගැන දේශනා කළ හැම තැනකම උන් වහන්සේ පව් නො කළ යුතු බව කීහ. ආයර්‍ය පදාර්ථය සඳහා පුන පුනා පින් රැස් කිරීම අනුදැන නැතත් ආයර්‍ය පදවිය සම්බන්ධ මූලික සුඛිත මුදිත භාවය ලබා ගැනීම සඳහා කෘෂ්ණ කර්ම විරතියත් සුක්ල කර්ම සමාදානයත් නිරතුරුවම දේශනා පාලියේ හමු වේ. (කණ්හං ධම්මං විප්පාහාය සුක්කං භාවෙථ පණ්ඩිතො[2]) පව් නොකළ යුතු බවත් සැප සඳහා පින් කළ යුතු බවත් ධම්ම පදය නිතරම පෙන්වා දෙයි.

න තම්හි ඡන්දං කයිරාථ දුක්ඛො පාපස්ස උච්චයො[3]

තම්හි ඡන්දං කයිරාථ සුඛො පුඤ්ඤස්ස උච්චයො

ධම්ම පදයේ පාපය සඳහා කම්ම කිලිට්ඨ යන්නත් පින සඳහා කම්ම විසුද්ධි යන්නත් භාවිත කිරීම වැදගත් කරුණකි. කර්මයේ පිරිසිදු බව හා අපිරිසිදු බව මින් කියැවේ. කළ යුත්ත හා නොකළ යුත්ත මෙහිදී වටහා ගත හැකි ය. වරක් තථාගතයන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසූ බ්‍රාහ්මණයෙක් "ශ්‍රමණ භවත් ගෞතමයෝ කිරියවාදි ද අකිරියවාදී දැයි" විමසී ය. ඊට පිළිතුරු දෙන තථාගතයන් වහන්සේ තමන්වහන්සේ කිරියවාදීත් අකිරියවාදීත් වන බව පළ කළහ. බමුණාට ප්‍රහේලිකාවක් වූ මෙම ප්‍රකාශය විස්තර කරමින් තමන්වහන්සේ

---

2. ධම්මපදය - පණ්ඩිත වග්ගය 12. ගාථාව.
3. ධම්මපදය - පාප වග්ගය 2,3, ගාථා.

දුශ්චරිත විෂයෙහි අකිරියවාදී බවත් සුචරිත විෂයෙහි කිරියවාදී බවත් පෙන්වා දුන්හ.[4] මෙහිදී පුඤ්ඤ පාප යන නම් හැර සුචරිත දුශ්චරිත යනුවෙන් යොදා ගැනීම සැලකිය යුත්තකි. තවද ..... කත්තබ්බං කුසලං බහුං .... බොහෝ කොට කුසල් කළ යුතු යයි යන කියමන ද එසේම වැදගත් ය. කුසලය නිවන සඳහා මහත් උපස්තම්භකයකි. පුද්ගලයා පාපයෙන් මුදවා ගැනීම අළුත් සුචරිතයක යොදනවාට වඩා අපහසු කාරියක් බව සමය පිළිගෙන ඇත්තක් සේ පෙනේ. පාපයෙන් මුදවා ගැනීමට මජ්ඣිම නිකාය බාල පණ්ඩිත සූත්‍රය[5] ප්‍රයත්න කරන්නේ එහි අනිටු විපාක පෙන්වමිනි. පාපයේ ගිලිනහු ඉන් රසවත් වන්නහු තණ කන තිරිසනුන්ගේ ද ගුටි කන ඌරු බල්ලන්ගේ ද අඳුරේ වසන පණු ගැඩවිලන්ගේ ද වතුරේ වසන මාළු කැසබුවන්ගේ ද කුණෙහි වසන කුණු අනුභව කරන සතුන්ගේ ද සහව්‍යතාවයට යන බව එහි සඳහන් ය. තවද පාපය නිසා මිනිසත් බවින් ගිලිහුනහු නැවත මනු ලොව ජන්ම ලාභය දුලභ කරුණකැයි ද පැවසේ. කායික සාමාජික විෂමතා ඔවුහු පෙළනු ලබති. මෙසේ පාපය මෙහි අනිටු විපාක ගෙන දෙන අතර පින එහි යහපත් පැත්ත ගෙනදෙයි. පාර ලෞකික වශයෙන් ලබනවාට වඩා මෙහ ලෞකික වශයෙන් ලබන විපාකය සාමාන්‍ය ජනතාවගේ සිත්හි කා වැදේ. ඉන් ඔවුහු පාපයේ විරමණය පිළිගනිති. චූල්ල කම්ම විභංග සූත්‍රයේ දී ද මිනිස් ලොව ඌණතා සහිත උපදින්නේ පව් කොට නිරයේ නූපන්නො යයි පැවසේ. පින සහ පව පුද්ගලයාගේ උසස් හා පහත් බව තීරණය කරන සාධකයකි. (සෙය්‍යථාපි චුන්ද යෙ කෙචි අකුසලා ධම්මා සබ්බෙ තෙ අධො භාවං ගමනීයා කුසලා ධම්මා සබ්බෙ තෙ උපරිභාවං ගමනීයා[6]) මේ සැමෙකකින්ම සූචිත වනුයේ කුසලය කළ යුත්තක් සේත් අකුශලය නො කළ යුත්තක් සේත් දැක්වීමකි.

4. අංගුත්තර 2:1:4:3'
5. මජ්ඣිම නිකාය - 3:3:9
6. මජ්ඣිම නිකාය. - 1:1:8, සල්ලේඛ.



බුදුසමයේ කර්මය පුද්ගල ස්වාධීනතාව තහවුරු කරන එක් සාධකයකි. ........ කම්මස්සකා මානව සත්තා කම්මදායාදා කම්මයොනි කම්ම බන්ධු කම්ම පටිසරණා කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පනීතතායි[7].... යන පාඨයෙන් සත්වයෝ කර්මය දායාද කොට ඇත්තාහු යි ගැනෙත්. පුද්ගලයා අන්‍ය වූ බලවේගයක් මගින් පාලනය කරනු ලබන්නක් නොව ස්වතන්ත්‍ර ස්වාධීන සත්වයකැයි සමය පවසන්නේ ඉහත කී අයුරිනි. ජීවත්වීම සඳහා මිනිසා තමා විසින් කරනු ලබන හොඳ නරක දෙක ඔහුගේ අනාගතය තීරණය කරනු ලබන කාරකයන් ය. එහිලා අන්‍යයකුගේ ප්‍රාධාන්‍යය බුදුසමය ප්‍රතික්ෂෙ කරයි. ............ කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පනීතතායි ......... යි පුද්ගල වෙමත්තතාව පරිබාහිර අභිමතයක් පරිදි නොවන්නක් බවට ඉදිරිපත් කළ හැකි මාතෘකා පාඨය වන්නේ ය. තමාගේ උපරිභාව ගමනීය හෝ අධොභාව ගමනීය වීම තමා විසින් පුරුදු පුහුණු කරන ලද ක්‍රියාකාරකම් අනුව සැකසුනකි. තමාගේ අභිමතයකි. බුදු සමයේ කර්ම වාදයේ විශිෂ්ඨතම ලක්ෂණය නම් එහි ස්ථාවර පදනම හා බැඳි මේ දෘඪ සම්බන්ධතාවයි.

බුදුසමය කියන පරිදි කුසලයේ හා අකුසලයේ සීමාවන් කවරේදැයි දත යුතු ය. පුද්ගලයා කෙරෙන් බාහිර සමාජයට වන අයහපත අකුසල යයි ගැනීම බෞද්ධ අකුසලය පටු කර දැක්වීමකි. ....... සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානෝ එවං ජානෙය්‍යාසි. යං බො අහං ඉදං කායන/වාචාය/මනසා කම්මං කත්තුකාමො ඉදං කායකම්මං/වචීකම්මං/ මනොකම්මං අත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය අකුසලං ඉදං කාය/වචී/මනො කම්මං සුකුද්‍ය යං දුක්ඛ විපාකන්ති. එව රූපං තෙ රාහුල කායෙන/වාචාය/මනසා කම්මං සසක්කං කරණීයං. සචෙ පන ත්වං රාහුල පච්චවෙක්ඛමානො එවං ජානෙය්‍යාසි. යං බො අහං ඉදං කායෙන/වාචා/මනසා කම්මං කත්තුකාමො ඉදං මෙ කාය කම්මං/ වචී කම්මං මනො කම්මං නෙවත්තව්‍යාබාධායපි සංවත්තෙය්‍ය න

7. මජ්ඣිම නිකාය - 3 4 5 චූලකම්ම විභංග.

පරව්‍යාධායපි සංවත්තනය්‍ය කුසලං ඉදං කාය/වචී/මනො කම්මං සුඛුද්‍රයං සුඛ විපාකන්ති. ඒව රූපං තෙ රාහුල කායෙන වාචාය/මනසා කම්මං කරණීයං [8]..... මේ පාඨයෙන් අකුසල හා කුසල යනු කුමක්දැයි මනාව පෙන්වා දෙයි. කොටින් දක්වතොත් කය වචනය සිත යන තිදොරින් කළ කම් තමාට හෝ අනුනට හෝ දෙකොටසටම හෝ අවැඩ පිණිස පවතී ද දුක ගෙන දේද දුක් විපාක ගෙනදෙයි ද එය අකුසල් ගණයට වැටේ. තිදොරින් තමාට අනුනට හෝ දෙපිරිසටම යහපත පිණිස පවතිනුයේ කුසල ය. මෙයින් ද කුසල අකුසල යන පදාර්ථ වඩාත් පුළුල් විස්තීර්ණ වූවක් බව පෙනේ. මේ අනුව අකුසල හා කුසල කම් දළ සැළැස්මකට අනුව බෙදා දැක්විය නො හැකි වඩා ශිථිල වූ ධර්මබව පෙනේ. මෙරමා සතු ජීවත්වීමේ අයිතිය හා සන්තකය ආරක්ෂා කිරීමට බෞද්ධයා බැඳී සිටී. කායික වශයෙන් තමාට අහිත පිණිස ක්‍රියාවක යෙදුනහොත් එය අකුසලයක් වේ. අනුන්ගේ සිත් රිදවීමට වඩා ආත්ම පරිහානිය සඳහා සම්පප්‍රලාප හේතුවන හෙයින් ඒද අකුසල් ගණයට ඇතුළත් කලා විය යුතු ය. තමා ඇතුළු සමාජයේ අභ්‍යුදයට බාධාකර වූ සිතිවිල්ල පවා අකුසල් ගණයට අයත් වේ. මේ අනුව අකුසලය බෞද්ධයාට පහසුවෙන් මගහැරිය හැක්කක් නොවන බව පැහැදිලි වේ. කුසලය යනු මෙහි ප්‍රතිවිරුද්ධ පැත්තයි. තිදොරින් තමාට හෝ අනුන්ට හිතවත් යමක් කිරීම කුසල් ගණයට මෙහි ලා අන්තර්ගත ය. කුසල චේතනාවම මහත් කුසලයක් බව කීප තැනක දීම දේශනා කොට ඇත. ..... චිත්තුප්පාදම්පි ඛො ආවුසො කුසලෙසු ධම්මෙසු බහු කාරං වදාමි. කො පන වාදො කායෙන වාචාය අනු විධියතාසු[9].... කුසල් දහම් කෙරෙහි සිතිවිලි ඉපදීම ම පුද්ගලයාට මහත් උපකාරයකැයි එහි කියවේ. පින යන්නට වඩා කුසලයත් පව යන්නට වඩා අකුසලයත් වඩා පුළුල් අදහස් ඇත්තක් බව මින් පෙනේ. පුද්ගලයාගේ ආයෂ් පදවි ලාභය මේ කුසල (කුසලතා) මත පිහිටා ඇත. ඔහු ආයෂ් පදවිය සඳහා අකුසල වන්නේ හෙවත් පරාජිත වන්නේ අකුසලයන්හි හැසිරීම

8. මජ්ඣිම - 2 : 2 : 1. අම්බලට්ඨිකා රාහුලෝවාද.
9. මජ්ඣිම නිකාය - 1: 1: 8: සල්ලෙඛ



තුලිනි. කුසල හා අකුසල යන්නේ උපයෝගී අර්ථය එයයි. කුසල හා අකුසල යන දෙක සහමුලින්ම රැස්කිරීම් ගණයට අයත් නොවේ.

තිදොර සංවර කර ගැනීම මෙහිදී ද අභිමත ය. බාලයා සහ පණ්ඩිතයා අතර වෙනස ද්වාරත්‍රයමය ක්‍රියා ආශ්‍රයෙන් කෙරේ. යට කී පරිදිම දුච්චින්තිත චින්තී දුබ්භාසිතභාසී දුක්කත කම්මකාරී වූවහු බාලයකු බවත් සුචින්තිත චින්තී සුභාසිතභාසී සුක්කත කම්මකාරී වූවහු පණ්ඩිතයකු බවත් කියැවේ.[10] පුද්ගලයා සමාජය සමග සබඳතා පවත්වා ගන්නා මාධ්‍යයන්ගේ නිරවද්‍ය වූ පැවැත්ම මින් අපේක්ෂිතයි. මිනිසා ජීවත්වීම සඳහා කරන දෑ වැරදි අයුරින් කිරීම තමාගේ හෝ අනුන්ගේ අභිවෘද්ධිය සඳහා හේතු භූත නොවන බව මෙයින් ද පෙන්වා දෙයි. තිදොර සංවර කිරීම ගැන ධම්මපදය නිතර උපදෙස් දෙයි.

**"කායෙන සංවරො සාධු සාධු වාචාය සංවරො, මනසා සංවරො සාධු"**

සංවරය යනු කායික හෝ මානසික ඌණතාවකින් පෙලෙන අලස ප්‍රතිපත්තියක් ලෙස ගැනීම අනුමත කළ හැකි නොවේ. සංවර වූ පුද්ගලයා මනා වූ කාය ශක්තියකින් හෙබි සෞඛ්‍ය සම්පන්න පුද්ගලයකු විය හැක. ඔහු ක්‍රියා ශීලී ය. අනලස් ය. එහෙත් ඔහුගේ කටයුතු කිසිවකුට අහිත පිණිස දුක් පිණිස හා පහසු විහරණය පිණිස නොවේ. හඬ නගා කථාකිරීම හෝ නිරතුරු ක්‍රියාශීලී වීම අසංවර ගණයට ඇතුලත් කිරීම අශාස්ත්‍රී ය.

මජ්ඣිම නිකාය පර්යාපන්න සෙවිතබ්බා සේවිතබ්බ සූත්‍රය ද මෙහි දී වැදගත් ය. නිවැරදි වූ කාය සමාචාර, වචී සමාචාර, මනො සමාචාර, චිත්තුප්පා ද, සඤ්ඤා පටිලාභ, දිට්ඨිපටිලාභ, අත්තභාව පටිලාභ, ෂඩින්ද්‍රිය යන කරුණු සෙවිතබ්බ

10. මජ්ඣිම නිකාය - 3 : 3 : 9 - බාල පණ්ඩිත

ධර්මයන් ලෙස දක්වා ඇත. එහි සාවද්‍ය වූ ප්‍රතිපත්ති අසෙවිතබ්බ ධර්ම ලෙස විස්තර කෙරේ. අසෙවිතබ්බ ධර්මයන් සේවනය කළහොත් "......... කුසලා ධම්මං පරිහායන්ති අකුසලා ධම්මා **අභිවඩ්ඪන්ති** ..." මෙහි කියන සෙවිතබ්බ ධර්මයන් යනුවෙන් විශේෂ යමක් හඳුන්වනු නො ලැබේ. න සෙවිතබ්බ ධර්මයන්ගේ විරතියක් පමණක් එහි දී අපේක්ෂිත ය. බෞද්ධ සීල සමාදානය ද මෙසේම ය. "...... වේරමණී ..... සමාදියාමි ....." (වැලකීමක් සමාදන්වෙමි) යන්නෙන් වැරදි කිරීමෙන් වැලකීම සීල සමාදානයකි. මෙම වැලකීම තුළ කිරීමක් ද ඇතුළත් ය. නිදසුනක් ලෙස "....**පාණාතිපාතා** පටිවිරතො ....." යන්නෙන් වැළකීමක් කියවෙතත් ".... ලජ්ජීදයාපනෙනා සබ්බ පාණභූතෙසු හිතානුකම්පී විහරති ....." යන්නෙන් කිරීමක් කියවේ.) කුසල යන්නෙන්ද මෙසේ විශේෂ අළුත් යමක් කිරීමට නොව අකුසල ගණයට අයත්වන දේ නො කර සිටීම ගැනේ. ආයර්‍ය පදාර්ථය සඳහා යෝග්‍ය පසුබිමක් තැනෙනුයේ එවිටයි. සීල සමාදානයත් කුසලයත් බොහෝ විට විරති සමාදානයක් වනුයේ එසේ ය.